(01) 00314

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/2018

නීති විද්‍යාව - LLU6813/LWU4321

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2020.02.22 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. (අ) "නියමාකාර ස්වාධිපත්‍යයක් සහිත පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් වෙනත් කිසිදු ස්වාධිපත්‍යයකට යටත් නොවන බවට වන ඔස්ටින්ගේ කරුණ පැහැදිලිය. කෙසේ වුවද මෙම නිශේදනාත්මක අදහස දහනව වන සියවසේ දේශපාලන යථාර්ථයන්ගේ සන්දර්භය තුල පවා අනවශ්‍ය ලෙස සීමාකාරී වූවක් බවටත් විසිවන සහ විසිඑක් වන සියවස්වලට අදාලව එය වඩාත් සීමාකාරී වන බවටත් තර්ක කල හැකි ය."

*McCoubrey & White's Textbook on Jurisprudence,(2008) 5th ed.p 44*

සමකාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය, දේශපාලනික සහ සමාජීය කරුණු ඔස්ටින්ගේ ස්වාධිපත්‍යය පිළිබඳ සාම්ප්‍රදායික අවබෝධයට අභියෝගයක් වී ඇතැයි ඔබ සිතන්නේ ද?

අවම වශයෙන් අධිකරණ බල <u>තුනක</u> උදාහරණ උපුටා දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 15)

(ආ) ප්‍රකෘති නීතිය යන වදනට අන්තර්ගත වන්නේ පහත සඳහන් ඒවායින් කවරක් ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

**(i)** වයස අවුරුදු 15 ට අඩු ළමයින්ට වැඩිහිටියකු සමග හෝ නැතිව සිනමා ශාලාවලට ඇතුළු වීමට ඉඩ නොදිය යුතු බවට කොන්දේසියක් පනවමින්, කැන්ඩියානා මහනගර සභාව අනු නීතියක් සම්මත කර තිබේ.

**(ii)** චාරිත්‍රානුකූල නීතිය (ලකුණු 05 x 2 = 10)

02. නෛතික රීතීන් හි අන්තර්ගතය මැනීමට සහ නෛතික ප්‍රඥප්තීන් ඇගයීමට, නීතිවේදීන් සතු ප්‍රබල මෙවලමක් බවට ස්වාභාවික නීතිය පත්ව ඇති ආකාරය විශ්ලේෂණය කරන්න.

ඔබේ මතය අනුව නීති පද්ධතිය සකස් කිරීමේදී ස්වාභාවික නීතිය විසින් ඇති කර ඇති වඩාත් ම ගැඹුරු බලපෑම කුමක් ද?

අදාල අධිකාරීන් මගින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 25)

03. 1970 දකුණු ඉරානියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, වසර පහක කාල සීමාවක් සඳහා රොනල්ඩ් මහතා දකුණු ඉරානියාවේ ජනාධිපතිවරයා වශයෙන් 2015 පෙබරවාරි මාසයේ දී තේරී පත් විය. මීළඟ ජනාධිපතිවරණය සඳහා රට සූදානම් වෙමින් සිටිය දී, 2019 දෙසැම්බර් මාසයේ දී ජනාධිපතිවරයා, 1970 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොසලකා හරිමින් සියලු රාජ්‍ය බලය පවරා ගනිමින්, ව්‍යවස්ථාදායක සභාව විසිරුවා හැර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කළේ ය. මේ අතර 1970 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ විපක්ෂය විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීත්‍යානුකූල භාවය පිළිබඳව දකුණු ඉරානියානු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් උපදෙස් ලබා ගත්තේ ය. දකුණු ඉරානියානු රාජ්‍ය මාධ්‍ය වාර්තා කළේ කුමන්ත්‍රණය සාර්ථක වූ බවත්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීත්‍යානුකූලව වලංගු වන බවත්, විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස පෙර පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවලංගු වන අතර එය තව දුරටත් නීතියේ කොටසක් නොවන බවත්ය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිව ජනතාව අතර කිසිදු විරෝධයක් නොමැති බවත් ඔවුන් එය රටේ උත්තරීතර නීතිය ලෙස පිළිගෙන ඇති බවත් රොනල්ඩ් මහතා මාධ්‍යයට ප්‍රකාශයක් කලේය.

කෙල්සන්ගේ න්‍යායට අනුව දකුණු ඉරානියාහි තත්ත්වය විශ්ලේෂණය කරන්න.

අදාල අධිකාරීන් මගින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 25)

04. "ඓතිහාසික ගුරුකුලයේ මූලික විශ්වාසය නම් නීතිය පිහිටා ඇත්තේ ජනතාවගේ ජීව ගුණය තුල බවය. ඔවුහු චාරිත්‍ර, නීතියේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස සැලකූ හ. මෙකී විශ්ලේෂණය ගැටළු වලින් තොර වූවක් නොවේ."

ඓතිහාසික ගුරුකුලයට එරෙහිව එල්ල වූ ප්‍රධාන විවේචන මොනවා ද?

ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 25)

05. "ආර්ථික පදනම සහ නීතිය අතර සම්බන්ධතාවය උපරි ව්‍යුහයේ අංගයක් ලෙස දැකීම එක් අර්ථයකින් උපකරණාත්මකය. සරලව කිවහොත්, මෙම මතය අනුව නීතිය යනු පාලක පන්තිය විසින්, නිර්ධන පංතියේ හිංසනය සහ ආධිපත්‍ය සඳහා යොදා ගනු ලබන මාධ්‍යයකි. රාජ්‍යය සහ එහි නීතිය පාලක පන්තියේ ග්‍රහනයේ පසුවන අතර සිය අභිලාෂයන් මුදුන්පත් කර ගැනීම වෙනුවෙන් ඒවා භාවිතා වේ."

*McCoubrey & White's Textbook on Jurisprudence,(2008) 5th ed.p 205*

මෙම මාක්ස්වාදී ස්ථාවරය සමකාලීන නීති පද්ධති පිළිබඳ සැබෑ චිත්‍රයක් නියෝජනය කරයි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 25)

06. "ස්කැන්ඩිනේවියානු තත්ත්වාකාර වාදයේ කේන්ද්‍රීය කරුණ නම් නීතිය මිනිසුන්ගේ හැසිරීම වෙනස් කරනු ලබන ආකාරය පැහැදිලි කිරීමයි. සාම්ප්‍රදායික පැහැදිලි කිරීම්වල අන්තර්ගත මනෝවිද්‍යාත්මක අංගයන්ගෙන් තොරව නීතියේ බලය විද්‍යාත්මකව පැහැදිලි කිරීමට ඔවුහු උත්සාහ කරති."

*Suri Ratnapala, Jurisprudence,(2009),p.109*

නූතන සමාජ සන්දර්භය තුල ස්කැන්ඩිනේවියානු තත්ත්වාකාර වාදයේ සුවිශේෂී ලක්ෂණවල අදාලත්වය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 25)

07. ඇමරිකානු තත්වාකාරවාදී ව්‍යාපාරයේ දාර්ශනික පදනම් සාකච්ඡා කර, එය ශ්‍රී ලංකා නීති පද්ධතියේ සැබෑ ස්වභාවය අවබෝධ කර ගැනීම සඳහා කොතරම් දුරකට අන්තර් දෘෂ්ටීන් ලබා දෙන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 25)

08. සමකාලීන සමාජ ආර්ථික සහ දේශපාලනික සන්දර්භය තුල ගැටුම් සමථයකට පත් කිරීමේදී නීතිවේදීන් සහ ව්‍යවස්ථාදායකයන්ගේ කර්තව්‍යය පිළිබඳව පවුන්ඩ්ගේ පැහැදිලි කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, පවුන්ඩ්ගේ න්‍යායයෙහි ප්‍රධාන අංගයන්ගේ අදාලත්වය විශ්ලේෂණය කරන්න. (ලකුණු 25)

හිමිකම් ඇවිරිණි.